NCP/CS/ED/11/3-1

2024.03.12

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 01/2024

උතුරු මැද පළාත්,
සියළුම ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් වෙත,

ඉදිකර අවසන් ගොඩනැගිලි සහ ඉදිකරමින් පවතින ගොඩනැගිලිවල ආබාධ සහිත පුරවැසියන් සඳහා ප්‍රවේශ පහසුකම් ඇති කිරීම

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුව ඔවුන්ට පළාත් සභාවට අයත් ආයතන පරිශ්‍රයන් තුලට බාධාවකින් තොරව පහසුවෙන් පිවිසීමට හැකි වන පරිදි ප්‍රවේශ පහසුකම සම්පාදනය කල යුතු වුව ද ඇතැම් ආයතන මේ සම්බන්ධව අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ .

02. 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 වන වගන්තිය සමඟ බැදී ඇති 25 වන වගන්තිය යටතේ සමාජ සේවා හා සුභ සාධන අමාත්‍යාවරයා විසින් සම්පාදනය කරන ලද ප්‍රවේශ නියෝගය (2006.10.17 අංක 1467/15 අති විශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කරමින් නිකුත් කර ඇති 2009.09.18 අංක 1619/24 ප්‍රවේශ නියෝග) හා පොදු ගොඩනැගිලි වෙත පිවිසීම සම්බන්දයෙන් 2009.10.14 වැනි දින SC(FR)221/2009 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පිළිබඳව ඔබේ අවධානය යොමු කරවමි.

03. ඒ අනුව, උක්ත නියෝග අනුව ඔබ අමාත්‍යාංශ සහ අමාත්‍යාංශ යටතේ පවතින ආයතන තුලට ආබාධ සහිත තැනැත්තන්ට බාධාවකින් තොරව ප්‍රවේශ වීමේ පහසුකම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් දන්වා සිටිමි.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

ɔ/C